# උද්‍යාන අලංකරණ නිර්මාණ
# 09 පාඩම





# හැදින්වීම

මිනිසා තමාට වාසය කිරීමට නිවාස තනාගත් අතර එම නිවාස පිහිටි පරිසරයද අලංකරණය කර ගැනීමට විවිධ ක්‍රමවේද අනුගමනය කර ඇත.මෙම පරිසරය අලංකරණ පිළිබද අතීතයට පිවිසීමේදී විවිධ උයන්හි නටබුන් වී ගිය කොටස් තුලින් ඒ බව සනාථ වේ.ලෝක ඉතිහාසයේ ඉපැරණිතම ශිෂ්ටාචාරයන් වූ මොහෙන්ජදාරෝ හරප්පා මෙන්ම ඉන්දු නිම්න ශිෂ්ටාචාර වල කැනීම් තුලින් මතු වූ විවිධ මූර්ති කොටස් මෙන්ම බටහිර ජාතීන්ගේ පුනරුද සමයේ සකස් කල වීනස් දෙවුදුවගේ ප්‍රතිමාව, ඩේවිඩ් ප්‍රතිමාව ආදිය හැදින්විය හැක.





ශ්‍රී ලාංකිකයින් වන අපටද එවන් උද්‍යාන අලංකරණ ක්‍රම තිබූ බව අනුරාධපුර, පොළොන්නරුව, ආදී නටබුන් තුළින් පැහැදිලිව පෙන්වා දිය හැකිය.

- අනුරාධපුර රන්මසු උයන
- සීගිරිය උද්‍යානය





අනුරාධපුර කුට්ටම් පොකුණ අසල ඇති පුන්කලස ආසියාවේ ඇති උසස්ම පුන්කලස් වන අතර සිගිරිය උද්‍යානයේ ඇති ජලමල්අතීත ශ්‍රී විභූතිය හා අතීත නිර්මාණ ශිල්පීන්ගේ දස්කම් විදහා දක්වන කැඩපත් බඳුය. බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් අනතුරුව ඔවුන්ගේ සංස්කෘතිය මිශ්‍ර වූ සංකල්පයන්ද රැගත් උද්‍යාන අලංකරණ නිර්මාණයට නිර්මාණ ශිල්පින් පෙළඹි ඇති බව එම යුගයන්හි ඉදි වූ මන්දිර ඇසුරින් පැහැදිලි වේ.

උදා -: කළුතර රිච්මන්ඩ් කාසල් මැදුර
එඩිෂන් බංගලාව

ආදී ස්ථාන වල පවතින උද්‍යාන මුර්ති





වර්තමාන වන විට බොහෝ දෙනෙකු තම වත් පොහොසත් කම් අනුව ඔවුන් ජීවත් වන නිවස හා ගෙඋයන අලංකරණයට ක්‍රියා කරයි.එබැවින් උද්‍යාන අලංකරණ කලාව විශේෂ ආර්ථික වාසි ගෙන දෙන කලාවක් ලෙස ප්‍රචලිත පවතී. එබැවින් උද්‍යාන අලංකරණ උපාංග වෙළඳ පොළෙන් මිලදී ගැනීමට හැකියාව ඇති අතර තම කැමැත්ත අනුව නිර්මාණ ශිල්පින්ලවා ඉදිකර ගැනීමට හැකියාව ලැබේ.

මෙම අලංකරණ කෘති නිර්මාණයේදී මුර්ති හා කැටයම් යන ක්‍රම ශිල්ප දෙකම භාවිත කරනු ලබයි.









# මූර්ති සඳහා යොදා ගන්නා ක්‍රම

- **පූර්ණ උන්නත**

එනම් නිර්මාණයට යොදා ගන්නා මාධ්‍යයෙන් මූර්තිය හෝ
කැටයමේ සම්පූර්ණ මතු වීම පෙන්නුම් කිරීම සිදු කිරීමය
උදා -: අවුකන පිළිමය
දඹේගොඩ බෝසත්රුව

- **අර්ධ උන්නත**

නිර්මාණයට යොදා ගන්නා මාධ්‍යය තුලින් සම්පූර්ණ
මතු නොකළ ඉදිරි පෙනුම පමණක් මතුකර දැක්වීමයි
(අඩක් මතුවන සේ)
උදා -: ඉසුරුමුණි පෙම් යුවල
බුදුරුවගල බෝසත් පිළිමය

- **අල්ප උන්නත**

මද වශයෙන් මතුකර දැක්වීම අල්ප උන්නත වේ





# උද්‍යාන විද්‍යා මූලධර්ම

- අවකාශය - නිර්මාණය ස්ථාන ගත කිරීමට සුදුසුම ස්ථානය තෝරා ගැනීම
- සම්පිණ්ඩනය - නිර්මාණයට ගැළපෙන හැඩතල එකතු කරන්නා වූ ආකාරය
- අනුපාතය - හැඩතල වල පරිමාව නියමිත ප්‍රමාණවලට යොදා ගැනීම
- විවිධත්වය - නිර්මාණයේ අගය උද්දීපනය සඳහා අනුගමනය කරන නිර්මාණශීලි ක්‍රමවේද
- තෝරාගන්නා ස්ථානය - මූර්තිය ස්ථානගත කිරීම
- සමබරතාවය - මූර්තිය හෝ කැටයම පුරාම පැවතිය යුතු ගැලපීම
- කැපිපෙනෙන සුළු බව - නිර්මාණය ගොඩ නැගීමෙන් අනතුරුව එය දර්ශනය වන ආකාරය ඉස්මතු කිරීම
- නිමාව - ඉහත මූලධර්ම එක්කර මූර්තිය හෝ කැටයම ගොඩනගා නිම කිරීම

අතීතයේ කළු ගලින් නෙළූ පිළිම වර්තමානයේදීත් දැක ගත හැකිය.

උදා -: සමාධි පිළිමය

අවුකන පිළිමය

ගල් විහාර පිළිම

පැරකුම්බා පිළිමය





# උද්‍යාන අලංකරණ උපාංග

## අතීත මූර්ති ශිල්පීන් භාවිත කළ ද්‍රව්‍ය

- ගල්
- ලෝහ
- කිරිගරුඬ
- දැව
- මැටි

## වර්තමානයේ භාවිත කරන ද්‍රව්‍ය

- ලෝහ
- කළුගල්
- සිමෙන්ති
- කිරිගරුඬ , ෆයිබර්
- මැටි ,ප්ලාස්ටර් ඔෆ් පැරිස්

# සිමෙන්ති මාධ්‍යයෙන් උද්‍යාන නිර්මාණයේදී යොදා ගන්නා ද්‍රව්‍ය

- සිමෙන්ති
- වැලි
- කම්බි
- කුකුළු දැල්
- ලෑලි කෑබලි
- ඇණ

## මූර්ති හා කැටයම් සඳහා භාවිත වන උපකරණ



# උද්‍යාන මූර්තියක් නෙලීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- පළමුව අදාළ නිර්මාණයේ සැකිල්ල දැල් හෝ කම්බි මගින් සකස් කර ගත යුතුය
- සාදාගත් සැකිල්ල සිමෙන්ති මිශ්‍රණය යොදා පුරවා ගන්න.(සිමෙන්ති හා සිහින් වැලි අනුපාතයට යොදා පුරවා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය හැඩතල මතුකර ගන්න )
- සකස් කිරීමෙන් අනතුරුව වියලීමට තබා කැමති වර්ණයක් භාවිත කර අලංකරණය කර ගත යුතුය.මේ සදහා ඉමල්ෂන්,ලැකර්,වාර්නිෂ් යොදා ගත හැකිය.

මෙසේ සකස් කරගත් මූර්ති හෝ කැටයම් අව්වට ,වැස්සට ,පින්නට ඔරොත්තු දීමේ හැකියාව මතත් එහි පවිත්‍රතාව ආරක්ෂාව මතත් දීර්ඝ කාලීනව පවත්වා ගත හැකිය. දුර්වර්ණ වූ අවස්ථාවන් හී නැවත වර්ණ ගැන්වා අලංකරණය කිරීම තුලින් මූර්තිය නෙත ගැටෙන්නන් හට එහී අභිමානය දිස්වෙනු ඇත.

# උද්‍යාන මුර්තියක් සකස් කර ගැනීමේ පියවර

## බිම්මලක් නිර්මාණය කිරීම

අවශ්‍ය අමු ද්‍රව්‍ය -:

1. 25 cm × 25 cm × 2.5 cm ප්‍රමාණයේ ලැලි කැබැල්ලක්
2. 6 mm කම්බි දිග 1.5 m දිග
3. කුකුළු දැල් 2 m පමණ
4. හලාගත් වැලි
5. සිමෙන්ති
6. ඉදිකිරීමට අවශ්‍ය උපකරණ

➢ පළමු පියවර

බිම්මම්ලෙහි සැකිල්ල සාදා ගත යුතුය .ඒ සදහා කම්බි භාවිත කරන්න





- දෙවන පියවර

සාදා ගන්නා ලද සැකිල්ල ලෑලි කැබැල්ලට සවි කර ගැනීම හා පසුව කුකුළු දැල එයට ගැට ගසා ගන්න





➢ තුන්වන පියවර

සිමෙන්ති එකකට වැලි කොටස් දෙකක් යොදා බදාම සකස් කර සැකිල්ලට යොදා ගත යුතුය .පසුව බිම්මලේ දණ්ඩ සුරා සකස් කර ගත යුතුය .වියලුනු පසු වර්ණ අලේප කර ගන්න



# වර්ණ අලේප කිරීම

- වර්ණ අලේපනය සදහා ඉමල්ෂන් හා ලැකර් වර්ණ භාවිත කරයි
- ඉමල්ෂන් වර්ණ -:වතුරෙන් දිය කර ගත හැක
- ලැකර් වර්ණ -:තීනර්,ටර්පන්ටයින් ,භූමිතෙල් භාවිත කරමින් වර්ණ දිය කර ගත හැක
- නිර්මාණයේදී දීප්තිය වැඩි කර ගැනීමට නම් රත්තරන් ,රිදී ,තඹ ආදී වර්ණ කුඩු භාවිත කළ හැක
- ඉමල්ෂන් තීන්ත භාවිත කිරීමේදී රන් ,රිදී ,තඹ දියකර ගැනීම සදහා බයින්ඩර් ගම් භාවිත කළ හැක
- ලැකර් වර්ග සදහා රන් ,රිදී , තඹ දියකිරීමට ක්ලියර් ලැකර් හෝ වාර්නිෂ් ලැකර් භාවිත කළ හැක
- සායම් අලේපනයට පින්සල් හෝ වර්ණ ඉසීමේ යන්ත්‍රය භාවිත කළ හැක

# බිතු කැටයම් නිර්මාණය (මියුරල්)

පියවර -:

- නිර්මාණයට අවශ්‍ය සුදුසු ස්ථානයක් තෝරාගත යුතුය.
- ඒ මත අදාළ චිත්‍රයේ දළ සටහන ඇදගන්න
- නිර්මාණයට ගන්නා බිත්තිය කඩතොළු කරගත යුතුය
- සිමෙන්ති කුඩු හා වැලි 1;2 අනුපාතයට බදුනට දමා ජලය අවශ්‍ය පරිදි එක්කර මිශ්‍ර කරන්න .මෙහි දියර ගතිය අඩු විය යුතුය
- එම මිශ්‍රණයේ ඇදගත් සිතුවම ඉස්මතු කරගත යුතුය
- චිත්‍රය කැටයමක් ලෙස මතුකර ගත් පසු හොඳින් වියලීමට තබා වර්ණ කරගත යුතුය

# පල්ප මාධ්‍යයෙන් මූර්තියක් නිර්මාණය කිරීම

## පල්ප මාධ්‍ය සකස් කිරීම

අවශ්‍ය ද්‍රව්‍ය -: කඩදාසි හෝ ලීකුඩු
පල්මානික්කම්
බයින්ඩර් ගම්
කරාබු නැටි තෙල් /ලින්සීඩ් ඔයිල්

- කඩදාසි සිහින්ව ඉරා පැය24 පමණ ජලය සමග පෙගෙන්නට තබන්න
- දිය බේරා ගත් කඩදාසි වංගෙඩියක් හෝ බ්ලෙන්ඩරයක දමා හොඳින් අඹරා ජලය මිරිකා ඉවත් කරන්න
- එම කඩදාසි කෘමින්ගෙන් ආරක්ෂා කර ගැනීමට කරාබු නැටි තෙල් හා ලින්සීඩ් ඔයිල් තේ හැදි 2 ක් මිශ්‍ර කරගන්න
- බයිඩර් බන්ධන කාරකයක් ලෙස යොදා හොඳින් අනා පදම් කර පල්ප සාදා ගන්න
- ලී කුඩු වලින් පල්ප සකස් කරන්නේ නම් දින 3 ක් ජලයේ පෙගෙන්නට තබන්න.බන්ධන කාරකයක් ලෙස පාන්පිටි ,පාප්ප,ලී කුඩු මිශ්‍ර කරන්න.කෘමින්ගෙන් ආරක්ෂා වීමට පල්මානික්කම් යොදන්න

# පල්ප මාධ්‍යයෙන් නිර්මාණය කිරීම

අවශ්‍ය ද්‍රව්‍ය -: කඩදාසි පල්ප ,ලී කුඩු පල්ප
කුකුළු දැල්
බයින්ඩර් ගම්
6mm කම්බි
කරාබු නැටි තෙල් ,ලින්සීඩ් ඔයිල්
ලී කැබැල්ලක්
වර්ණ

- නිර්මණය කිරීමට අවශ්‍ය රූපයේ ආකෘතිය ඇද ගැනීම කළ යුතුය
- නිර්මාණයට අවශ්‍ය පරිදි ලෑලි කැබැල්ලකට ඇණ ගසා පාදම සකස් කර ගන්න
- කම්බියෙන් නිර්මාණයේ හැඩය සකස් කර ඒ මත කුකුළු දැල් යොදා සැකිල්ල සකස් කර ගන්න
- එයට ලී පතුරක් ආධාරයෙන් පල්ප මාධ්‍ය පුරවන්න
- ඇඹීමේ උපකරණ උපයෝගි කර ගනිමින් හැඩය ලබා ගන්න
- සකස් කර ගත් නිර්මාණය වේලෙන්නට තබන්න
- වර්ණ ආලේපනය කරන්න

# ප්ලස්ටර් ඔෆ් පැරිස් මාධ්‍යයෙන් උද්‍යාන අලංකරණ නිර්මාණය

අවශ්‍ය ද්‍රව්‍ය -:ප්ලස්ටර් ඔෆ් පැරිස් කුඩු

ලී කැබැල්ලක්

6mm කම්බි

හැඩගැන්වීමේ උපකරණ

ජලය

ඇණ

කුකුළු දැල්

වර්ණක

පල්ප හා ප්ලස්ටෙර් ඔෆ් පැරිස් මූර්ති වර්ණ ගැල්වීමෙන් පසු පිරියමක් ලෙස ක්ලියර් වාර්නිෂ් අලේප කිරීමෙන් නිර්මාණයේ වර්ණ ආරක්ෂා වී දීප්තිමත් පෙනුමක් ලබා දේ